මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
நிதி, பொருளாதார அபிவிருத்தி, கொள்கை வகுத்தல், திட்டமிடல் மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC DEVELOPMENT, POLICY FORMULATION, PLANNING AND TOURISM

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 09.11.2024

**මාධ්‍ය නිවේදනය**

**<u>සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සම්බන්ධයෙන් නව රජයේ ස්ථාවරය</u>**

2024.09.27 දිනැති සහ අංක 2403/53 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි ඇතුළත් කරුණු පදනම් කර ගනිමින් මහජනතාව නොමග යවන සුළු ප්‍රවෘත්ති නිර්මාණය කිරීම හා ඒවා ජනතාව අතර ප්‍රචාරය කිරීමට විවිධ පාර්ශ්වයන් උත්සාහ දරමින් සිටින බව නිරීක්ෂණය වී ඇත.

**"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්"** යන නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ පෝෂණයෙන් පිරුණු ළමා පරපුරක් ව්‍යාපෘතිය යටතේ පෝෂ්‍යදායී ආහාර, අවශ්‍යතා ඇති පවුල් සඳහා ලබාදීම රජයේ ප්‍රමුඛතාවයක් වන අතර (පිටු අංක 67) එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනික හා යටිතල පහසුකම් හඳුනා ගෙන සැලසුම් ක්‍රියාත්මක කිරීම දැනටමත් සිදුවෙමින් පවතී. එසේම පෝෂ්‍යදායී ආහාර සැපයීම ඇතුළු සමස්ත ළමා සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සඳහා ද නව රජය කැපවී සිටී (පිටු අංක 83).

එසේම රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යවසායයන් වැඩිදියුණු කිරීම රජයේ ප්‍රතිපත්ති රාමුව තුළ පැහැදිළිව ඇතුළත්ව තිබෙන බව ද අවධාරණය කර සිටී. එම ජන වරම තුළ කටයුතු කරන රජය, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම ඈවර කිරීම සඳහා කිසිඳු සැලසුමක් හෝ ක්‍රියා මාර්ගයක් නොගන්නා බවත් එසේ කිරීම නව රජයේ ප්‍රතිපත්තිය හා අනුකූල නොවන බවත් පෙන්වා දෙනු ලැබේ. ඒ බව අමාත්‍යාංශයන්හි විෂයයන් හා කාර්යභාරයන් ප්‍රකාශයට පත් කරමින් නිකුත් කර ඇති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි ද පැහැදිලිව සඳහන්ව ඇත.

ඒ අනුව දරුවන් හා ගැබිණි මව්වරුන්ට ත්‍රිපෝෂ ලබාදීමේ වැඩසටහන වඩාත් ඵලදායීතාවයකින් යුතුව ඉදිරියටත් ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා දෙමින් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම වඩාත් ශක්තිමත් හා කාර්යක්ෂම ආයතනයක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාමාර්ගයන් කඩිනමින් ගනු ලබන බවටත් ප්‍රකාශ කර සිටී.